# අපේ පෞරාණික ජන සමාජය තුළ ගම හා වැව අතර ගොඩනැගුණු ජීවන ක්‍රියාවලිය

## (රජරට ප්‍රාදේශීය වැව්ජන සංස්කෘතියට විශේෂයෙනි)

*සේන නානායක්කාර*

**ප්‍රවේශය**

ගම හා වැව වූ කලී නූතන ජන සමාජය තුළ වුව ද වඩාත් අවධානයට යොමුවන්නකි. විවිධ විෂය ක්ෂේත්‍රයන්ට හා විවිධ සමාජ පාර්ශවයන්ට අදාළ ව ගත් කල ඒ කෙරෙහි ආරෝපණය කළ හැකි සුවිශේෂතා අපමණ ය. නමුත්, ගම හා වැව පිළිබඳ මෙම අධ්‍යයනයෙන් අවධානය යොමු කෙරෙනුයේ රජරට පුරාණ ජන සංස්කෘතිය පසුබිම් කොටගෙන ය. එබැවින්, එය නූතන සමාජ ප්‍රවණතාවලට හෝ විචල්‍යතාවලට හෝ සංඝටනවලට වඩා වෙනස් වූවකි.

සාම්ප්‍රදායික වියළි දේශගුණ ලක්ෂණයෙන් අනන්‍ය රජරට භූමි කලාපය වූ කලී, මුළුමනින් ම කෘෂි ආර්ථිකයක් පසුබිම් කොටගෙන ගොඩනැගුන කි. එබැවින් ම, එය ග්‍රාමීය කෘෂි සමාජ වපසරියක් ලෙස හැඳින්වෙයි. ඒ අනුව, එහිදී වැවට හිමිවෙන වැදගත්කම අතිශය සුවිශේෂ ය. වැවකින් තොර ගමක් නැති තරම් ය. ගම නම්කිරීමේ සිට එහි පැවැත්ම හා අනාගතය තීරණය කෙරෙන සියලු සාධක කෙරෙහි වැවේ බලපෑම කැපීපෙනේ. වඩාත් සංක්ෂිප්ත ව ගතහොත් 'වැව' යනු ගැමි ජන ජීවිතයේ සමාජ, ආර්ථික හා සංස්කෘතික ඇතුළු සකලවිධ ක්‍රියාකාරකම්වල කේන්ද්‍රීය මූලය ලෙස නිර්වචනය කළ හැකි ය.

ගම හා වැව ආශ්‍රිත ව බැඳුණු දෛනික ක්‍රියාකාරකම් විමසීමේදී ගැමි ජන සමාජය තුළ එවක පැවැති අරමුණු, පරමාර්ථ, විශ්වාසයන් හා එහිලා පසුබිම් වූ සන්නිවේදනාත්මක ස්වරූපයන් ද හෙළිදරව් කෙරේ. වැව්ලේකම්, වෙල්විදානේ හා ගමරාල ආදී භූමිකාවන් ද ඒ හා බැඳුණු රාජකාරි ද එහි සුවිශේෂ ය. එකී පරිපාලන තනතුරුවලට හා සාමාන්‍ය ගැමි ජන සමාජයට අදාළ ව ගොඩනැගුණු 'වැව් රාජකාරි' පිළිබඳ මෙම අධ්‍යයනයෙහිදී වඩාත් පැහැදිලි කෙරේ. 'බෝල බැඳීම' ආදී පරිපාලන සන්නිවේදන ක්‍රමෝපායයන් මෙන්ම, 'මුට්ටි නැමිල්ල' බඳු අභිචාර ක්‍රියා ද එහිදී ප්‍රධාන වෙයි. කෙසේ වෙතත්, වැව යනු රජරට පුරාණ ගැමි ජන සංස්කෘතියේ ජීවනාලිය ලෙස මෙහි අවධාරිත ය.

නූතනය වන විට ක්‍රමයෙන් විකාශනය වෙමින් පවත්නා රජරට ගැමි ජන සමාජයෙහි අතීතය විමර්ශනයේදී ගම හා වැව අතර ගොඩනැගුණු සම්බන්ධතාව අතිශයින් සන්නිවේදනාත්මක ය. එහි යථා ස්වරූපය පිළිබඳ සොයා යාම මෙකී අධ්‍යයනයේ අරමුණ වෙයි. ඒ අනුව, රජරට පුරාණ ජන සංස්කෘතියේ ගම හා වැව ආශ්‍රිත ව බැඳුණු දෛනික ක්‍රියාකාරකම්වල ස්වරූපය කෙබඳු ද? යන්න මූලික ගැටලුව ලෙස ගැනේ. සමාජ විද්‍යාත්මක විෂය මූලික රීතීන් යටතේ සියලු විමර්ශන කටයුතු සිදුකෙරුණු අතර, එය මූලික වශයෙන් ප්‍රධාන ක්‍රමවේදයකට පමණක් සීමාකළෙමි. එනම්, අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ පවත්නා, මුද්‍රිත මාධ්‍ය ප්‍රමුඛ කොටගත් පොත්පත්, සඟරා, ලිපිලේඛන ඇතුළත් ලිඛිත සාහිත්‍යය පරිශීලනය කිරීම යි. සමාජ විකාශනයට අනුකූලව සලකා බලන කල අතීතය, වර්තමානය හා අනාගතය සාපේක්ෂ ව සසඳා බැලීමේ විමර්ශනාත්මක රීතිය වඩාත් ඵලදායී බැව් මෙහිදී අවධාරණය කෙරෙන්න කි.

## විමර්ශනය

රජරට පුරාණ ජන සමාජය පිළිබඳ විමර්ශනය කිරීමේදී ගම හා වැව අතර දක්වෙන සම්පස්ථභාවය සුවිශේෂ වෙයි. ගමෙන් වැව හෝ වැවෙන් ගම වෙන්කොට සාකච්ඡා කිරීම නිෂ්ඵල ව්‍යායාමයක් වන තරමට ම එහි සම්බන්ධතාව අතිමහත් ය. ගම යනු කුමක් ද? පුරාණ ලාංකේය සමාජ සංවිධානයෙහි මූලිකතම ව්‍යුහාත්මක කේන්ද්‍රය වූයේ ගම යි. ජනාවාසයෙහි ලා ගෝචර, සාමාන්‍ය ජන ජීවිතයට ඇවැසි අවම භෞතිකමය පහසුකම් සහිත බිම් පෙදෙස් ඒ සඳහා වෙන්කොට ගැනිණි. පුද්ගල පැවැත්ම උදෙසා පිටුබල සැපයිය හැකි සකලවිධ ආයතනික ව්‍යුහයන් එහි දක්නට ලැබිණි. ගේ දොර, ඉඩකඩම්, හේන් කුඹුරු, ඇලදොළ, කඩපිල, කැලෑරොද හා පන්සල ද එහි සුවිශේෂ විය. ඉඳුම් හිටුම්, කෑම්බීම්, සිරිත්විරිත් ඇතුළු කුදුමහත් සමාජ සංස්කෘතික චර්යාවන් කෙරෙහි ලා එතුළින් පසුබිම් සැකැසුණු බව පෙනේ.

'වැව' යනු ඒ සියල්ලෙහි මූලකේන්ද්‍රය ලෙස හැඳින්වෙයි. මන්දයත්, යහපත් ජන ජීවිතයක් කෙරෙහි ලා ඒ සියල්ල ඓන්ද්‍රීය ලෙස බැඳී පවත්නේ වැව හා සම්බන්ධ ක්‍රියාවලිය මගිනි. එබැවින්, වැව වූ කලී ගමේ ආත්මය හෙවත් ජීවනය ලෙස සලකන්නට ගැමියෝ හුරුපුරුදු වී සිටිය හ.

ඒ අනුව ගත්කල වැව යන්නෙන් අදහස් කළේ ද ගම ම බව තතු දත්තෝ පවසති. පහත දැක්වෙන උපුටාගැනීම් කිහිපය සලකා බලමු. "වැව් අමුණු පිහිටි ප්‍රදේශවාසී ගම්මුන්ගේ සිරිත්විරිත් දක්නා කවරෙක් වුවත් මේ ස්ථානවල 'වැව' යැයි කියන්නේ 'ගම'කට බැව් දැනගෙන සිටිත්. ඊට නිදර්ශනයක් නම්, ගම්වැස්සෝ ඔවුන් සියඹලාගහවැවට අයිති යැයි කියත්. ඔවුහු සියඹලාගහවැවට අයිතියි කියනවා මිසක සියඹලාගහගමට අයිතියි නොකියත්. මෙයාකාරෙන් 'වැව' යන්නෙන් 'ගම' යන්න හැඟේ"[1].

1910 සිට 1949 දක්වා වසර 39 ක් ලංකා මිනුම් දෙපාර්තමේන්තුවේ සේවය කළ විශිෂ්ට ලාංකීය බුද්ධිමතකු වන ආර්.එල්. බ්‍රෝහියර් විසින් ලියා පළකරන ලද "Ancient Irrigation Works in Ceylon" නම් කෘතියෙහි සිංහල පරිවර්තනය වූ "ලක්දිව පුරාතන වාරිමාර්ග" ග්‍රන්ථයෙහි සඳහන් තොරතුරු ඒ සඳහා ඉදිරිපත් කළ හැකි වැදගත් ම සාක්ෂි ලෙස සඳහම්. සැබැවින් ම, මෙය අතිශයෝක්තියක් නොවේ.

"ඇත්ත වශයෙන් ම ගැමි අර්ථ ක්‍රමය, ජලය රැස්කර තබාගැනීම වටා ගෙතුණකි. මේ ප්‍රදේශයේදී ජලය කොතරම් වැදගත් වී ද යත් වැව හා ගම යන වචන දෙක සමානාර්ථයෙන් ම යෙදුනේ ය. සමහර ස්ථානවල ගම යන වචනය ව්‍යවහාර කරන ලද්දේ කලාතුරකිනි. මිනිසුන් අයත් වූයේ සියඹලාගහ'ගම'ට නොව, සියඹලාගහ'වැව'ට ය"[2]

හෙළ ජන සංස්කෘතිය හා සභ්‍යත්වය පහළ වූයේ ත්, වැඩුනේ ත් වැව් ආශ්‍රිත පරිසරය තුළ බව බොහෝ බුද්ධිමතුන්[3] පෙන්වා දී ඇත. "යම් විධියකින් කෘතිම ජලාශයන් මේ අයුරින් නොතිබුණා නම් එහි ජීවත්විය හැකි ව තිබුණේ සාංක්‍රමණික ජනගහනයකට පමණක්"[4]බව ඔවුන් අවධාරණය කරනුයේ ද පූර්වෝක්ත අදහස තවදුරටත් තහවුරු කරමිනි.

වැවේ පිහිටීම, ස්වභාවය, හැඩරුව හා හාත්පස පරිසරය අනුව ද එය නම් කෙරුණි. නාමිකව පෙන්නුම් කරන ලද වැවට අදාළ අනන්‍යතා රාශිය කි. අප රට වැව් කර්මාන්තයේ ආරම්භයේ පටන් අද දක්වා ම මෙකී සුවිශේෂීතාව නොවෙනස් ව පවතියි. වඩාත් පුරාණ ඓතිහාසික සාක්ෂි මඳකට අමතක කොට මෑතකාලීන ව කරන ලද පුළුල් පර්යේෂණ අධ්‍යයන තුළින් හෙළිදරව් කෙරෙන දත්තයන් අනුව ගත් කල ද මෙය සපුරා සත්‍යයක් යැයි කීම සාවද්‍ය නොවේ. මේ උද්ධෘතයෙන් හෙළිදරව් කෙරෙන්නේ ද එකී කාරණය ම ය.

"එදා වැව්බැඳි රටේ ඇත්තෝ වැව මුල්කරගෙන ගමට නම යෙදූහ. සෑමවිට ම ගමේ නමේ අගට යෙදී ඇත්තේ 'වැව' හෝ දෙමළ වහරින් 'කුලම' යන්න යි. ඒ අනුව ඇතැම් විට වැවට යෙදුණු නමට ඒ ආශ්‍රිත වෘක්ෂලතා කේන්ද්‍ර විය. කෝන්ගස් ගහන වැව 'කෝන්වැව' ය. ඒ අනුව ගම ද 'කෝන්වැව' විය.

1 ආර්.එල්. බ්‍රෝහියර්, **ලක්දිව පුරාතන වාරිමාර්ග**, පරිවර්තනය. එල්. පියසේන. (කොළඹ: මහවැලි කේන්ද්‍රය, 1935), 2 පිට.
2 රැල්ෆ් පීරිස්, **සිංහල සමාජ සංවිධානය**. (කොළඹ: සීමාසහිත සමන් ප්‍රකාශකයෝ, 1964), 249 - 250 පිටු.
3 මාර්ටින් වික්‍රමසිංහ, **උපන්දා සිට**. (කොළඹ: තිසර ප්‍රකාශකයෝ, 1945), 11 පිට.
4 රැල්ෆ් පීරිස්, **සිංහල සමාජ සංවිධානය**. (කොළඹ: සීමාසහිත සමන් ප්‍රකාශකයෝ, 1964), 249 පිට.

සියඹලාගහවැව, දිවුල් වැව, අන්දර වැව, පලුගස් වැව, මීගස් වැව, හල්මිල්ල වැව ආදිය ඊට නිදසුන් ය."[5]

සියඹලාවැව එදිනෙදා කට වහරට වැටෙන විට 'සියඹලෑව' වෙයි. උච්චාරණයේ පහසුව සලකාගෙන ය. 'ගෝනා වැව' ජනවහරට වැටී ඇත්තේ 'ගෝනෑව' යනුවෙනි.[6] ඒ අනුව බොහෝ ගම් දිවුල්ලෑව, මීගස්සෑව, හල්මිල්ලෑව, පළුගස්සෑව, තම්මැන්නෑව, දුණුමඩලෑව, රඹෑව හෝ කැඳෑව විය.

ඊට අමතර ව, වැව ආශ්‍රිත භූමි භාගයේ භෞතික ස්වරූපය, වැවේ ආරම්භය හා බැඳුණු සමාජ පසුබිම, පුද්ගල විශේෂතා, කුලගෝත්‍ර හා සමාජ ප්‍රභේද, සමාජ සංස්කෘතිකමය බැඳීම් හා වෙනස් සුවිශේෂ සම්බන්ධතා ආදිය ද මෙකී නාමකරණය සඳහා පාදක වී ඇත. කලාවැව ත්, බළලු වැව ත් මුල් කොටගෙන කියැවෙන මේ ජනකවිය ඊට නිදසුනක් ය.

**"කලා වැවේ කලවැල් දිගිලිය කැටියා**
**බළලු වැවේ බළලෙකු අඬ අඬ හිටියා**
**එහෙව් වැවට ගල්ගිරි රන්දෙක හිටියා**
**බලන් නෑනො වැව් දෙක එක ළඟ හිටියා"**

වැවට කෙබඳු නමක් ගත්ත ද එය ගම බවට පත් වූ බව ත්, එයින් තොර පැවැත්මක් ගමට නොතිබූ බව ත් කීම අතිශයෝක්තියක් නොවේ.

ගැමි ජන ජීවිතයේ පැවැත්ම උදෙසා වැවෙන් කෙරුණු මෙහෙවර අප්‍රමාණ බවට ත්, එය ගැමි ජන සමාජයේ හෘදස්පන්දනය වූ බවට ත් දෙස් දෙන ප්‍රබලතම ඓතිහාසික සාධකය වන්නේ රජරට නුවරකලාවිය ප්‍රමුඛ සතර දිග්බාගයෙහි දස දහස් ගණනින් ගොඩනැගුණු වැව් කර්මාන්තය යි. ඒ අනුව, "වැව් බැඳි රටේ ඇත්තන්ගේ හඳුන්පොත වන්නේ වැව යි."[7] 'හඳුන්පොත' යනු 'හදවත' යි. ලොකු කුඩා සෑම ගමකට ම වැවක් හෝ දෙකක් තිබිණි. ප්‍රථම රාජධානිය හෙවත් අනුරාධපුරය මුල්කොටගත් රජරට, "වැව් බැඳි රාජ්‍ය" හෙවත් "වැව් දාහේ රට" ලෙස නාමකරණය වන්නට හේතුව ද එය ම ය.

බදුලු දිසාවේ උප ඒජන්තවරයකු ව සිටි බේලි මහතා විසින් 1815 වර්ෂයේ දී ලියා පළකරන ලද වාර්තාවක මෙසේ සඳහන් වෙයි.

"පෙර කල කරන ලද අතිවිශාල වැව් කර්මාන්ත සමහර විට ලක්දිව තරම් ලොව අන්කිසි රටක දක්නට නොලැබෙන්නේ ය යනු මගේ විශ්වාසය යි. තවද, මෙරට ඒ ඒ සීමා ඇතුළත දක්නට ලැබෙන තරම් වැව් අමුණු කර්මාන්ත අන් රටක ඒ තරාතිරමේ සීමා ඇතුළත දක්නට දුෂ්කර විය යුතු යි. මෙතරම් කුඩා වූ ත් අන් රටක මේ සා පැරණි වූ ත්, විශාල වූ ත්, සංඛ්‍යාවෙන් උසස් වූ ත් වැව් අමුණු තවත් ඇතැයි සිතිය නොහේ."[8]

"යුරෝපයේ ගොවි කර්මාන්තය බොහෝ අශාස්ත්‍රීය සේ අක්‍රමවත් ව පහත් අවධියක පැවැති කාලයෙහි මෙරට මිනිසුන් ඉතා වෙහෙස දරා දක්ෂ ලෙස ශාස්ත්‍රානුකූල ව තැනූ අප්‍රමාණ වැව් අමුණුවලින් නිසරු ප්‍රදේශයෝ සාරවත් වූ හ. ධන ධාන්‍යයෙන් ආඪ්‍ය ව බැබැලුන හ."[9]

එහෙයින් ම ලංකාව අභ්‍යන්තරයෙහි ක්‍රියාත්මක වූ වැව් ගොඩගැනීම ලොව අන් කිසිදු දේශයක සිදු නොවූ බව ඔහු තවදුරටත් අවධාරණය කරයි. "පර්යේෂණයන්ගෙන් ඔප්පුවන්නේ ලංකාවේ තරම් දියුණුවක් සමකාලීන වාරි කර්මාන්තය ලෝකයේ අන් කිසිම ස්ථානයක පෙන්වා නොමැති බව යි"[10] මේ තත්වය ඇතිවීමට ප්‍රධාන හේතුව වූයේ ලංකාවේ වැසියන්ගේ ප්‍රධානතම ආහාරය බත් වීම ත්, ප්‍රධානතම ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තය වීම ත් බව පෙනේ.[11] 1660 සිට වසර විස්සකට

---

5 කේ.බී. මානෑව, **නුවරකලාවියේ ජන වහර**, (කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2001), 213 පිට.

6 ජේ.බී. දිසානායක, **සිංහල ජන වහර**, (කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ, 1976), 141-142 පිට

7 කේ.බී. මානෑව, **නුවරකලාවියේ ජන වහර**, (කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2001), 206 පිට.

8 ආර්.එල්. බ්‍රෝහියර්, **ලක්දිව පුරාතන වාරිමාර්ග**, පරිවර්තනය. එල්. පියසේන. (කොළඹ: මහවැලි කේන්ද්‍රය, 1935), 1:1 පිට.

9 **එම**, 1:1 පිට.

10 ආර්.එල්. බ්‍රෝහියර්, **බ්‍රෝහියර් හඳුනාගත් ශ්‍රී ලංකාව**, පරිවර්තක. අභය හේවාවසම්, (කොළඹ: සූරිය ප්‍රකාශකයෝ, 1973), 148 පිට.

11 **එම**, 159 පිට.

ආසන්න කාලයක් ලංකාවේ සිරකරුවකු ව සිටි රොබර්ට් නොක්ස් විසින් ද එකී ඓතිහාසික සත්‍යය ම හෙළිදරව් කොට ඇත. "මේ රටේ ප්‍රධාන ආහාරය බත් ය. එබැවින්, ප්‍රධාන ජීවන වෘත්තිය වන්නේ ත් ගොවිතැන ය. මිනිසා විසින් කළ හැකි උසස් ම රස්සාව ත් ගොවිතැන ය."[12]

උක්ත සමාජ පසුබිම අනුව වැව් ජලය භාවිතය හා එය ආරක්ෂා කරගැනීම සාම්ප්‍රදායික ලාංකේය ගැමිජන ජීවිතයේ සුවිශේෂතම සමාජ කාර්ය භාරයක් ලෙස ත්, පුද්ගල වගකීමක් ලෙස ත් සලකා ඇති බව පෙනේ. ජලය වූ කලී ජීවිතය පවත්වා ගැනීමෙහි ලා උපයුක්ත ප්‍රධානතම අවශ්‍යතාවක් වීම නිසා ත්, වියළි කලාපීය දේශගුණ තත්ත්වයන් යටතේ එය ආර්ථිකමය වටිනාකම් සහිත වැදගත් සාධකයක් වීම නිසා ත් ගැමියා ඊට දක්වූ ගෞරවය සහ භක්තිය අනල්ප ය.

"වැවේ වතුර කිසිවෙක් නිස්කාරණේ නාස්ති නොකරති. අපේ වැව් බැඳි රාජ්ජේ ගැමි ජනතාවෝ වැව් වතුරට රීරි ඉස්මටත් වඩා ගරුහා කරති."[13]මෙහි නිස්කාරණේ යැයි කීවේ නිකරුණේ හෝ හේතුවක් නැතුව යන්න යි. රීරි ඉස්ම යනු රුධිරය යි. ගරුහා කිරීම යනු ගරුකිරීම යි. වැව් බැඳි රටේ ගැමියන් වැව් වතුරට ගරු කරනුයේ තමන්ගේ ඇඟේ දුවන ලේවලට ත් වඩා වැඩියෙන් බව මෙයින් කියැවේ.

මෑත කාලය සම්බන්ධයෙන් කෙසේ වුව ද, අතීත තතු විමර්ශනය කිරීමේදී ද මේ අදහස වඩාත් කුළු ගැන්වෙන වගතුග සොයාගැනීම දුෂ්කර නොවේ. "සෑම කේන්ද්‍රගත ගමක් ම වැවකින් හා ඊට පහළින් පිහිටි වෙල් යායකින් ද සමන්විත විය. වැව ආරක්ෂා කරගැනීම හා ඇලවල් අලුත්වැඩියා කිරීම පිළිබඳ වගකීම ගම්වාසීන් වෙත පැවරී තිබිණි. මේ සඳහා තමන් සතු කුඹුරු පංගුවේ ප්‍රමාණයට අනුකූල වූ ශ්‍රමයක් වැය කිරීමට සෑම පංගුකාරයෙක් ම බැඳී සිටියේ ය."[14] රීස් ඩේවිස් නම් වූ සමාජ ශාස්ත්‍රඥයා විසින් වර්ෂ 1871 දී ප්‍රකාශ කරන ලද්දක් පීරිසුන් උපුටා දක්වනුයේ එසේ ය. පහත දැක්වෙනුයේ ඒ සඳහා වන තවත් නිදසුන කි.

"වී ගොවිතැනට ජලය අවශ්‍යම ය. එහෙයින් ම ගොවියෝ තම තමන්ගේ කුඹුරුවලට ජලය ලබාගැනීම සඳහා ත්, ලබාගත් ජලය අරපරිස්සම් කරගැනීම සඳහා ත් විශේෂ පරිශ්‍රමයකින් ක්‍රියාකරති. ජලය රැස්කිරීම සඳහා වැව් බැඳීමෙන් ද, රැස් වූ ජලය රැකගැනීම සඳහා අමුණු බැඳීමෙන් ද, රැකගත් ජලය නිසි පරිදි පරිහරණය කිරීම සඳහා වාරිමාර්ග තැනීමෙහි ද ඒවා පිළිසකර කිරීමෙහි ද ලංකාවේ ගොවියෝ ඉතා දක්ෂයෝ ය."[15]

අතීත වර්තමාන තොරතුරු එකිනෙකට ප්‍රතිසන්ධි ගැලපීමෙන් මේ කාරණය වඩාත් සුවිශේෂ වැදගත්කමක් දරන සමාජ ක්‍රියාවලියක් බව වටහාගත හැකි ය. අපේ යටගියාව පිළිබඳ තතු විමසන අත්දැකීම් බහුල නූතන ගැමි වියත් ගණයා ද එය එසේම අනුමත කරති. මේ කියමන විමසා බලන්න.

"ගමේ වැව අපට තවත් මව් කෙනෙකු බඳු ය. අප වදා හදා ඇතිදැඩි කළ අපේ මෑණියන්ගේ හැටි පාට ගුණ සුවඳ කියා නිම කළ නොහැකි සේ ම වැවේ විත්ති ද කියා නිම කළ නො හැකි තරමට ම තිබේ. ඒ නිසාවෙන් ම දරුවන් සිය මව්පියන් ආරක්ෂා කොට රැකබලා ගන්නා ලෙසින් ම අපේ ඇත්තන් ද වැව රැක බලා ගත් බව"[16] යනුවෙන් ඔවුහු අවධාරණය කරති.

එසේ නම්, පුරාණ ගැමි ගොවි ජනයා විසින් මේ කාර්යභාරය ඉටුකරන ලද්දේ කෙසේ ද? ඒ සඳහා ඔවුන් සතු වූ සමාජ යාන්ත්‍රණය කුමක් ද? ඊට අදාළ ව පැනවුණු නීතිරීති, අනපනත් මෙන්ම ඒ හා බැඳුණු යුතුකම් හා වගකීම් කවරේ ද ? ඒ සම්බන්ධයෙන් ගොඩනැගුණු නිලතල හා බලතල කෙබඳු ද? පොදුවේ ගත්කල වැව් ජලය භාවිතය ත්, වැව ආරක්ෂා කරගැනීම ත් යන කාර්යභාරයන් විධිමත් සමාජ යථාර්ථයක් බවට පත්කර ගැනීමෙහි ලා, පූර්වෝක්ත සියලු ස්වභාවයන් හරහා ගොඩනැගුණු සමාජ සන්නිවේදනාත්මක පසුබිම කවරාකාර ද? යන්න දැන් අපි විමසා බලමු.

---

12 රොබට් නොක්ස්, **එදා හෙළදිව**, පරිවර්තක. **ඩේවිඩ් කරුණාරත්න**, (කොළඹ: එම්.ඩී. ගුණසේන සහ සමාගම, 1696), 62 පිට

13 කේ.බී. මානෑව, නුවරකලාවියේ ජන වහර, (කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2001), 210 පිට.

14 රැල්ෆ් පීරිස්, **සිංහල සමාජ සංවිධානය**. (කොළඹ: සීමාසහිත සමන් ප්‍රකාශකයෝ, 1964), 244 පිට.

15 රොබට් නොක්ස්, එදා හෙළදිව, පරිවර්තක. ඩේවිඩ් කරුණාරත්න, (කොළඹ: එම්.ඩී. ගුණසේන සහ සමාගම, 1696), 62 පිට

16 ඒ.පී.බී. මාම්නියාවේ ඉලංගසිංහ, වැව්ගම් පඬුර : අපේ රැකියා, සිරිත් විරිත්, ඇදහිලි හා ජනවිඥාන විවරණය, (කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009), 31 පිට.

වැව කේන්ද්‍ර කොටගෙන ගොඩනැගුණු ගමට අයත් වූ සයලු පාරශවයන් එකට බැඳ පවතී. එ අනුව ඒ ඒ වැවට අදාළ ගම වූ කලී වනස්පතියෙන් හෙවත් මහ කැලෑවෙන් වට වූ ගංමණ්ඩිය සහිත ඊට ම අනන්‍ය පරවේනිගත ජීවන සම්ප්‍රදායයන්ගෙන් යුතු භූමි භාගයකි. මේවා හඳුන්වන ලද්දේ 'ගං කුඩුව' හෝ 'ගං කොටුව' ලෙස යි. වැව් ගම්මානයක කාගෙත් දිවට හුරු ව්‍යවහාරය වූයේ 'වැව් ගං කුඩුව' හෙවත් 'වැව් ගං කොටුව' යන්න යි.

පසු කාලයේදී ගමේ ගෙවල් ගොඩ "ගංගොඩ" ලෙස පෙරළෙන්නට ඇත්තේ එපරිද්දෙන් විය යුතු යැයි හැඟේ. මේ කවර ගමක වූවත් නායකත්වයෙහි ලා සැලකෙන අයෙක් විය. ඔහු ගමරාල හෙවත් මහගමයා ලෙස හැඳින්විණි. දිසාව, දිසා මොහොට්ටාල (රටේ මහත්තයා) වන්නි බණ්ඩාර, වන්නි මොහොට්ටාල, බද්දේරාල, ලියනරාල හා උන්ඩියරාල[17] ආදී නිලමක්කාර තානාන්තර රැසකට අනතුරුව පසුකාලීන ව වැව මූලික කොටගෙන නායකත්ව තනතුරු ක්‍රියාත්මක කෙරිණි.

"රජ දවස සිට ම වැව් පාලනය ට උදකපති, වැ වැජෑරුම්, කලා අරක්ක ආදී නිලයන් තිබී ඇත. පසුවට ඒවායේ නාම හා සොබාව වෙනස් වී ගම්ප්‍රධාන, ගම්මුලැදෑනි, මහ ගමරාල, වෙල් විදානේ, විදානේ, වැව් ලේකම්, වැව් සුපිරින්ටැන්ඩන්ට්, වී.සී.ඕ. (ග්‍රාමීය වගා නිලධාරී) ආදීන් ලෙස වැව හා සම්බන්ධ නිලකම් දරුවෝ ගම්වල රාජකාරීවල යෙදී තිබේ.

මේ අතරින් ගමරාල, වෙල්විදානේ, විදානේ රාල යන නම්වලින් කියැවුණු ගමේ මට්ටමේ නිල දරු අයට වැව පිළිබඳ රාජකාරී පැවරී තිබිණි. කලාබළලු වැව හා කලාවැව යෝධ ඇල යටතේ එක දහස් නවසිය දාහත වරුසේ දෙන ලද කන්න මීටිම් වාර්තාවකින් ද, වෙල්මුලාදෑනිවරුන්ට ඒ වන විට ත් පැවරුණු රාජකාරී ලිඛිතව ම තහවුරු කළ හැකි ය. වැව් රාජකාරිය බාර වූ 'විදානේ උන්දෑ' කුඹුරු ඉඩකඩම් ඇති වැවේ මුල්පංගු හිමි පරවේනි පැලැන්ති පෙළපත්කරුවෙකි. ඒ නිසා උන්දෑගේ වචනයට උඩින් කටයුතු කෙරුනේ නැත."[18]

පුරාණ ගංකොටුවක විදානේ උන්දෑ එතරම් ම බලසම්පන්න අයෙකි. සමහර වැව් ගමෙක මහ ගමයා ලෙස නම් කෙරෙනුයේ ද මේ තනතුර දරන්නා විය හැකි ය. වැවේ රාජකාරී සම්බන්ධයෙන් ඔහුට පැවරුණු බලතල අපමණ ය. එබැවින්, වැව් ජලය භාවිත කිරීම මෙන් ම වැව ආරක්ෂා කරගැනීම යන කාරණාවලදී සිදුකෙරෙන සියලු ක්‍රියාකාරකම්වල නායකත්වය පැවරෙනුයේ ඔහු වෙත ය.

සාම්ප්‍රදායික දේශගුණ රටාවන්ට අනුව අගෝස්තු සැප්තැම්බර් කාලයේදී රජරට නුවරකලාවියේ බොහෝ වැව් සිඳී යයි. අනිවාර්ය වූ වියළි දේශගුණයකට මුහුණදෙන මේ ගම්බිම්වලට එය එක්තරා අතකට කෘෂිකාර්මික විරාමයක් යැයි සිතුව ද, වී ගොවිතැන් සම්බන්ධයෙන් ගත් කල එය ප්‍රතිසංස්කරණ හා ආරක්ෂණ කටයුතු සඳහා වෙන් කෙරුණු කාල පරිච්ඡේදයක් වෙයි. වැව් රාජකාරී කෙරෙන්නේ මෙතැන් පටන් ය. වැව, ඇළ දොළ, වෙල හරහා පැළ පිළ දක්වා කෙරෙන භාවිතයටත්, එය අනාගතය සඳහා ආරක්ෂා කරගැනීමටත් අදාළ සියලු කටයුතු වැව් රාජකාරී ලෙස ගැනේ. මේ සියල්ල මෙහෙයවනු ලබනුයේ විදානේ උන්දෑ විසිනි.

ඒවා කොටස් දෙකක් ලෙස වර්ග කළ හැකි ය.

(i) වැව හා ඊට අදාළ සියලු ස්වභාවයන් ආරක්ෂා කරගැනීම ත්, ඉන් උපරිම ඵල ප්‍රයෝජන ලබාගැනීම ත් අරමුණු කොටගෙන ගැමියන් සිය ශ්‍රම ශක්තියෙන් හා සංවිධානාත්මක ඥානයෙන් ඉටුකරනු ලබන රාජකාරී සහ

(ii) වැව සපුරා පුරවාගැනීම ත්, එය රැකගැනීම ත්, එකී ජලයෙන් කෙරෙන ගොවිතැන් බත් සරු කරගැනීම ත්, සොබාදහමින් අපල උපද්‍රාවක් නොවන අයුරින් සියලු ප්‍රතිලාභ ලැබීම ත් අරමුණු කොට ගෙන අභිචාර විධි ලෙස දෙවියන් බුදුන් උදෙසා කෙරෙන පුද පූජා උපහාර හා වෙනත් ආගමික වතාවත් මගින් ඉටුකරනු ලබන දේව රාජකාරී වශයෙන් ඒවා කොටස් කළ හැකි ය.

---

17 රැල්ෆ් පීරිස්, **සිංහල සමාජ සංවිධානය**. (කොළඹ: සීමාසහිත සමන් ප්‍රකාශකයෝ, 1964), 258 පිට.

18 ඒ.පී.බී. මාමිනියාවේ ඉලංගසිංහ, **වැව්ගම් පඬුරු: අපේ රැකියා, සිරිත් විරිත්, ඇදහිලි හා ජනවිඥාන විවරණය**, (කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009), 32 පිට.

අවුරුද්දේ අගෝස්තු සැප්තැම්බර් වන විට ගමේ කුඹුරු පත්තැයමේ ගොයම් කපා පාගාගෙන අවසන් වෙයි. කන්නයක් වෙහෙස මහන්සි වී මහ පොළොව ත් සමග සටන් වැද පවත්වා ගත යුතු ජීවන චක්‍රයෙහි තවත් අදියරක් ඊළඟට ක්‍රියාත්මක කළ යුතු ය. වැ ජලයෙන් කුඹුරු කරන සියලු දෙනා මේ රාජකාරියෙහි "පංගුකරුවෝ" වෙති. වැවේ වතුර බීමට, නෑමට හා වගාවට යොදාගැනීම, ගවයන්ට තණ කැවීම, කැලේ දඩයම් කිරීම, මී කැඩීම, පැළඉණි කැපීම, වැට ඉණි කැපීම හා වැවේ මාළු අල්ලා ගැනීම යනාදී පොදු අයිතිවාසිකම් භුක්තිවිඳින සියලුදෙනා මෙහිදී පංගුකරුවන් ලෙස හැඳින්විණි.

"තමන් භුක්තිවින්දා වූ මෙම අයිතිවාසිකම් වෙනුවෙන් එක්තරා යුතුකම් හා සේවාවන් කොටසක් ද ඉටු කිරීමට පංගුකාරයෝ බැඳී සිටිය හ. උදාහරණ වශයෙන් ඔවුහු වැව හා ඇළවල් ප්‍රකෘතිමත් කිරීම හා ඒවා නිසි ලෙස පවත්වාගෙන යාමට සහාය විය යුත්තා හ. කැලෑබද ගම්වාසීන්ට තමන්ට රිසි තරම් ඉඩම් ප්‍රමාණයක් වගා කරන්නට ඉඩ ලැබිණි. නමුත්, ජලය ඉඩම් මෙන් බහුල නොවී ය. එපමණක් ද නොව, විශාල ම ගැටලුව වූයේ 'වන ප්‍රවාහය' විසින් තම වාසස්ථාන ගිලගැනීම වළක්වා ගැනීම ය. කැලේ තිබෙන ඉඩමෙන් කොටසක් සිය යැපීම සඳහා අස්වද්දා ගොවිතැන් කිරීමට පිළියෙළ කිරීමේදී ගමේ පංගුකාරයෝ සියලුදෙනා ම සහයෝගයෙන් වැඩ කළ හ"[19]

වැ කන්දේ "පොට කෙටීම" හෙවත් වැව් බැම්මේ කැලෑව කපා එය හෙළි පෙහෙළි කිරීම, 'ගොංගෑවිලි' හා 'වැ කඩවල' පිළිසකර කිරීම ආදිය මෙහිදී වැදගත් වෙයි. වතුර බීමට වැවට එන ගවයින් වැවට බසින්නේ වැ කණ්ඩියෙනි. නිරන්තරයෙන් කෙරෙන මේ කටයුත්ත නිසා වැ බැම්මේ කඩතොලු හා වළවල් ඇති වේ. මේවා හැඳින්වෙන්නේ 'ගොංගෑවිලි' නමිනි. සමහර ගැමියෝ 'ගොංග ටාව' යැයි ද කියති. කඩවල යනු වැ කන්ද කැඩී ඇති තැන් ය. වැව ඇතුළෙන් කට්ටි කපා ගොංගෑවිලි හා කඩවළ පිළිසකර කිරීම මෙහිදී සිදු කෙරේ. වැ බැම්ම හෙළිපෙහෙළි කිරීමේදී ත් සියඹලා, හල්මිල්ල, වීර, පළු, කුඹුක්, මී, නබඩ ආදී ගස් තෝරා බේරා ඉතිරිකිරීමට මෙන්ම එවැනි ගස් අලුතෙන් සිටුවීමට ද ගැමියෝ වග බලා ගනිති. ඒවා වැඩී විශාල ලෙස සිසිලත් සෙවණත් ලබාදෙන අතර වැකන්ද ශක්තිමත් කිරීම ද එමගින් සිදුවෙයි. වැවට මඩ සෝදාගෙන ඒම වළක්වන පෝටා වැටිය, පෙරහරණ රැකීම ද එකී රාජකාරියෙන් ම කොටසකි.

වැ කන්ද රැකීමේදී එය කට්ටි රාජකාරියක් ලෙස ඉටු කෙරිණි. දෙවියතක් ගැඹුරට දෙබඹයක් දිග පළල ප්‍රමාණය එක් කට්ටියක් ලෙස ගැනේ. එක් පංගුකාරයෙකුට පැවරෙන වගකීමක් ලෙස එය සිදු කෙරිණි. එකිනෙක නඩත්තු කරන ඉඩම් ප්‍රමාණ අනුව ඒ ඒ අයට හිමි කට්ටි ගණන කොතෙක් ද යන්න විදානේ විසින් තීරණය කරනු ලබයි. සමහර තැනෙක කට්ටි පුවරු එල්ලා සිටුවා තබා තිබෙනු දැකිය හැකි ය. කට්ටිය අයිතිකරුගේ නම එහි ලියැවී තිබිණි. එකී කට්ටියේ වැවේ පිට පැත්තේ පලය ද (පිට බෑවුම) වැව ඇතුල් පැත්තේ රළ පහරට ඔරොත්තු දුන් ගල්වැටිය ද (රළපනාව) ඔවුන් ආරක්ෂා කළ යුතු ය. වතුර පිරෙන කාලයට රළපනාව ශක්තිමත් ව තිබිය යුතු ය. එසේ නොවේ නම් සිදුවන විනාශය අතිමහත් යැයි අපේ පුරාණ ගැමියා දැනසිටි බව ඓතිහාසික මූලාශ්‍රවලින් හෙළිවෙයි.

"රළපනාව ලෙස තට්ටු තට්ටු වශයෙන් එකකින් එකක් ටික ටික පිටවෙන්ට හෙවත් තරප්පි වශයෙන් තියෙන්ට ගල් අල්ලා වැව් බැම්ම බැඳීම එකල සිංහල මිනිසුන් විසින් නොකරන ලද්දේ නම් රළ වේගයෙන් බැම්ම කා දමා කෙබඳු බැම්මක් වුවත් විනාශ වන්නේ ය."[20]

වැව සම්බන්ධයෙන් ගත් කල නියමිත දිනට වතුර බෙදීම, මුරතැබීම, සොරොව්ව හා දියකැට පහණ නිසි පරිදි නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම වැනි කාර්යයන් මෙන්ම ගැමියාගේ ජීවිතාරක්ෂාව, වතුර අරපිරිමැස්ම හා එහි ගෞරවය රැකගැනීම ත්, ආචාරධර්ම රැකීමට අවශ්‍ය පසුබිම සැකසීම ත් විදානෙ උන්දෑ වෙත පැවරෙන වගකීම් රාජකාරී වෙයි. කිඹුලන් සිටින මංකඩවලින් දියනෑම හා වතුර ගැනීම, පතුල පෑදෙන තරමට ම වැවේ වතුර ටික ගොවිතැනට ගැනීම, හොරෙන් මාළු ඇල්ලීම, වැව් කෝල්බඩ ගස්වලට නැඟ වෙඩිතබා මාළු දඩයම් කිරීම, වැවේ ජීවත්වන ඉබ්බන් වැනි සතුන් මරා මස්කෑම, වැ බැම්මේ කොටු අතු හා කැටවළවල් කැපීමෙන් වැවට වතුර බීමට එන සතුන් දඩයම් කිරීම, පච්චවඩම් සුම්බර බැඳ වැවට බැසීම, දරුවන් වැවට බස්සවා මුත්‍රා කරවීම හෝ මළ පහ කරවීම ආදී නුසුදුසු ක්‍රියා වැළැක්වීම ද ඔහු සතු වැව් රාජකාරී අතරට ගැනේ.

19 රැල්ෆ් පීරිස්, **සිංහල සමාජ සංවිධානය**. (කොළඹ: සීමාසහිත සමන් ප්‍රකාශකයෝ, 1964), 254 පිට.

20 ආර්.එල්. බ්‍රෝහියර්, **ලක්දිව පුරාතන වාරිමාර්ග**, පරිවර්තනය. එල්. පියසේන. (කොළඹ: මහවැලි කේන්ද්‍රය, 1935), 59 පිට.

එපමණක් නොවේ, වැවේ බීමට වතුර ගන්නා තැන් (දියමංකඩ), රෙදි සේදීම සඳහා පාවිච්චි කරන තැන (පිළී මංකඩ), නෑම සඳහා භාවිත කරන තැන (නාන මංකඩ) හා ගවයින් නාවන තැන (බොරදිය මංකඩ) වැනි ස්ථාන අවභාවිතය සඳහා යොදා ගැනීම ද තහනම් ය.

"ගමරාල අත්තා හෝ විදානේ උන්දෑ මෙකී තහනම් තහංචි පැණවූයේ 'අණ බෝලය' බැඳීමෙනි. 'අණබෝලය' යනු ආඥාවකි." සාමාන්‍යයෙන් තහනමට බෝල්පනා තුන්මිටක් නැත්නම් ඉහකොළ තුන්මිටක් ගත් අතර දිවිකදුරු තුන්මිටක් දිවිකදුරු රිටක පහතට වැටෙන සේ ජලයෙන් ඉහළට බැඳ සිටුවා තැබීම බරපතල දඬුවමක පෙරනිමිත්ත කි. එය ඉක්මවීමට ගමේ කිසිවෙක් කැමැත්තක් නොදැක්වී ය"[21] පුරාණ ගැමි ජන සන්නිවේදනය හා සමාජ සංස්කෘතික සිරිත් විරිත් මෙන් ම සමකාලීන නෛතික පසුබිම පිළිබඳව ද මෙහිදී වැදගත් කරුණු හෙළිදරව් කෙරේ.

ගමරාල හෝ විදානේ උන්දෑ විසින් පනවන ලද එබඳු නියෝගයක් හෝ නිල පයිංඩයක් නොසලකා හරින්නෙකුට හෝ උල්ලංඝනය කරන්නෙකුට දඬුවම් පැමිණවූයේ සම්මුති තීරණයන්ට අනුව ය. වැව් රාජකාරී පැහැර හැරියවුන්ට රිදී රුපියල්වලින් දඩ ගෙවන්නට සිදුවිය. තොවිල් තහංචිය, මගුල්තුලා තහංචිය, දිය තහංචිය ආදී දඬුවම් පැනවූයේ වඩාත් බරපතල ගණයේ වැරදිවලදී ය. 'දිය තහංචිය' යනු ඊළඟ කන්නයේ දී වැව ත්, වැවේ වතුර ත් භාවිතයට ගැනීම තහනම් කිරීම යි. එය ජීවත්වීමේ අයිතිය ද නැති කරන තරමේ බලවත් බව සතු දත් හු කියති. වැරදිකරුවා වරිග සභාවට පමුණුවා ගමරාල, විදානේ උන්දෑ ඇතුළු ගම් නායකයෝ මෙකී දඬුවම් පමුණුවති. ඊට එරෙහි වූ අයෙක් ද නැත. මන්දයත්, වරිග සම්මුතිය වූ කලී තත්කාලීන සමාජයේ ඉදිරි පැවැත්ම උදෙසා ම සකස්වූවක් බැවිනි.

සාමාන්‍ය ගැමියාට පමණක් නොවේ, වැව් රාජකාරී පැහැරහැරි ගමරාලට හෝ විදානේ උන්දෑට ද දඬුවම් පැනවිණි. තනතුරුවලින් පහ කෙරිණි. සුංගම් නැවතිණි. 'සුංගම' යනු ගැමියා ලබන ප්‍රතිලාභවලින් ගම්නායකයන් හෝ අදාළ ප්‍රධානීන් වෙත වෙන්කෙරෙන කොටසකි. වැව රැකීම හා වැව් ජලය නිසි පරිදි භාවිතය සඳහා ඇවැසි නීති රීති සම්පාදනය කිරීම ත්, ඒවා විධිමත් ලෙස ක්‍රියාත්මක කරවීම ත් ඇතුළු වැව් රාජකාරී වූ කලී ඔවුන් සතු ප්‍රධාන වගකීම් ගණයට වැටේ. නමුත්, ප්‍රශ්නකාරී අවස්ථාවලදී ත් සිය රාජකාරිය හරිහැටි ඉටුනොකරන ගම්රාලලා හා විදානේවරු ද සිටිති. මහවැසි ඇදවැටී වැව පිරී ඉතිරී ගොස් වැ බැම්ම කැඩී බිඳී පිටාර ගලා ගමක් විනාශ වෙන්නට යද්දී ත් ඒ ගැන නොසලකා හැරි මහ ගමයෙක් ගැන ගැමියන් සිය විවේචනය පළ කළ අයුරු අපූරු ය.

**"තාංගු දී මහ ජල කඳ වැව් බැම්මේ වැදුනා**
**අට ඉස්බක් ඉහට උඩින් රළගෙඩි ගොඩ නැගුනා**
**තාවුල්ලේ ඉඳිගස් ළඟ නරි ලතෝනි ඇසුනා**
**මහගමයෝ නිදි වැදුන ද කළිගු මැම්ම බිඳුනා"**

තනතුරු තානාන්තර දරුව ද, ස්වකීය යුතුකම් හා වගකීම් ඉටු නොකරන නිල බල ඇත්තන් එකල ගැමි සමාජයේ දැඩි දෝෂ දර්ශනයට ත්, පිළිකුලට ත් හසු වූ අයුරුයි ඒ.

එපමණක් නොවේ, වර්ෂාවෙන් වැවේ වතුර පිරුණු පසු ගොවීන් රැස්කරවා නමෝ විත්තියෙන් ඊළඟ කන්නයට වැඩ ඇල්ලීම ගැන සාකච්ඡා පැවැත්වීම, ඊට අදාළ තීන්දු තීරණ ඔවුන් වෙත දැනුම්දීම ත් විදානේ උන්දෑට පැවරෙන වගකීම් කි. වතුර බෙදීමේදී කිසිදු පක්ෂපාතීත්වයකින් හෝ භේදයකින් තොරව ඒ කාරිය ඉටු කිරීම ත්, ඇළ වේලි ඇතුළු ජලමං පිළිබඳ ව විධිමත් ව හොයා බලා කරහන් හෙවත් කණ්ඩිලම් දැමීම ද ඒ අතර වූ කාර්යභාරයක් විය. 'කරහන' යනු දියබෙදුමකි. ඇලවේලි බෙදෙන තැන හරස් අතට ලී කොටයක් වළලා කුඹුරු ප්‍රමාණය අනුව ලී කොටයේ විවරයක් කපා ඒ හරහා වතුර ගලායාමට සැලැස්වීම කරහන් හෙවත් කණ්ඩිලම් දැමීම යි.

'මුළු මසුන් ඇල්ලීම' ද වැව් රාජකාරිය කි. වැවේ වතුර අඩු වූ කල කෙරෙන මේ කාරිය සඳහා ගම්මැද්දේ සියලුදෙනා සහභාගී වෙති. සාමූහිකත්වය, අන්‍යොන්‍ය සහජීවනය, බෙදා හදාගෙන භුක්තිවිඳීම, සමානාත්මතාව හා පොදු අයිතිවාසිකම යන සමාජ හිතකාමී විශිෂ්ටතා විද්‍යමාන කෙරෙන පොදු කාරියක් ලෙස ද මෙය හැඳින්වෙයි.

21 ඒ.පී.බී. මාමිනියාවේ ඉලංගසිංහ, **වැව්ගම් පඬුර: අපේ රැකියා, සිරිත් විරිත්, ඇදහිලි හා ජනවිඥාන විවරණය**, (කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009), 33 පිට.

විදානේගේ දැනුම්දීමෙන් අනතුරුව වැවේ සංහිඳ ළඟට එක්රැස්වෙන තරුණ පිරිස, පුල්ලෑරෙ මුත්තාට, අයියනා හත්රජ්ජුරුවන්ට කෙරෙන යාතිකා කන්නලව්වකින් පසු කරක්ගෙඩිය ගෙන වැවට බසිති. 'කරක' යනු මාළු ඇල්ලීම සඳහා භාවිත කෙරෙන උපකරණය යි. "කරක්ගෙඩිය හදන්නේ කුරටියා, තරණ හෝ උල්කෙන්ද කෝටුවලින්. ඇඟිල්ලක් තරම් මහත දිග අඩි 3 ක් විතර ඇති කෝටු එකසිය විස්සක් විතර"[22] ඒ සඳහා යොදා ගැනේ.

මුළුමසුන් ඇල්ලීමේදී ද වැදගත්කොට සැලකෙන නීති රීති ගණනාවකි. පැටව්පොළ රකින මාළුන් (කූරියන්) ඇල්ලීම මෙහිදී නොකළ යුතු යි. ලොකු ලූලන් හැර අනෙක් පුංචි තිත්තයෝ, දණ්ඩි, කාවයියො, පෙතියො, කොකැස්සො, කනයි, හිරිකනයි, හුංගො, මගුරො, තෙලියො, අංගුට්ටො, වැලි හොම්බො, වලයි, පෙනවලයි වගේ පුංචි මාළු කරකට අසුවුණොත් නැවත වතුරට මුදාහැරිය යුතුයි. එසේ නොවුවත් ඒවා පංගු අතර නොබෙදා ඇල්ලූ අයට ම ලබාදෙයි. කළවැල් පොඩිකර මාළු මත් කිරීමෙන් ඇල්ලීම ත්, ඩයිනමයිට් වැනි වෙඩි පිපුරුම් වර්ග පාවිච්චි කිරීම ත්, පොඩි මාළුන් අසුවන සේ හිල් කුඩා දැල් දමා මාළු ඇල්ලීම ත් මෙහි දී නොකළ යුතු ය.

"මුළු මස් අල්ලා තුනෙන් දෙපංගුවක් පොදු ගොඩට ත්, එක් පංගුවක් කරක එබූ අයට ත් බෙදනව. පොදු ගොඩේ මාළු ලොකු කුඩා වෙන්කරල නිලමක්කාර පංගු බේරනවා. (ගමරාලට, මොහොට්ටි උන්දෑට, බද්දය උන්දෑට, අනුමැති උන්දෑට, වෙද අත්තට, ඉස්කෝලේ ගුරුන්නාන්සෙට, තොවිල්කරන රෙදි නැන්දට ආදි වශයෙනි.) කනවැන්දුම් හා අතපය අබල දුබල රෝගී අයටත් කොටහක් වෙන් කරනව. ඉතිරිය වෙලේ පංගුකාරයින්ට කොටස් අනුව අයිතිවෙනවා"[23]

වැවට අදාළ සියලු සේවාවන් සම්බන්ධයෙන් සාධාරණ වූ පොදු භුක්තිය ගැමියා ක්‍රියාත්මක කළ අයුරු මෙයින් පිළිබිඹු වෙයි. මෙවැනි නීති රීති හා සමාජ සම්මුති හේතුකොටගෙන අනාගතය උදෙසා වැව සංවර්ධනය කොට රැකගැනීම ත්, එහි ජලය කාලානුරූප ව නිසි පරිදි භාවිතය ත් සිදු කෙරිණි. සියලු සාධු සම්මත සද්චර්යාවන් වැව ඇසුරෙන් ගොඩනැගෙන බව පෙන්වාදීමේ පූර්වාදර්ශය නිසාම වැව කෙරෙහි ගැමියා තුළ උපදිනා ගෞරවාන්විත හැඟීම මෙහිදී වඩාත් වැදගත් වෙයි.

ගැමියාගේ පුද්ගලික ශ්‍රමයෙන් හා ඥාණයෙන් ඒ සඳහා ගත හැකි එබඳු ක්‍රියාමාර්ගයන්ට අමතර ව, වැව් රාජකාරී වශයෙන් ආගමික පුද පූජා හා වත් පිළිවෙත් රාශියක් ද ඔවුහු අනුගමනය කළ හ. ගැමියාට පාලනය කළ නොහැකි නොපෙනෙන බලවේග උදෙසා කෙරුණු උපකාරමය හෝ කෘතගුණවේදී පූජාවන් ලෙස ගැනුණු ඒවා බොහෝදුරට 'දේව රාජකාරී' ලෙස ද නම් කෙරිණි.

මුට්ටි නැමීම, කිරි ඉතිරිවීම, පුල්ලෙයාර්මුත්තා පිදීම, මහදානය, අයියනා බණ්ඩාර බත් මාලාව පිදීම, කඩවල රැක්ම, පූජා වෙඩිල්ල (පූජා විදමන) හා මුරික්කාඩි බැඳීම (සමහර ගම්බිම්වල හඳුන්වන පරිදි) පූජා පොරොන්දුව ඉෂ්ට සිද්ධ කිරීම ත් මේවා අතරට ගැනේ. වැව් ජලය නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම ත්, අව්වැසි සුළඟින් හෝ කැලෑවෙන් සිදුකෙරෙන සියලු අපල උපද්‍රවයන්ගෙන් එය ආරක්ෂා කරගැනීම ත් යන උත්තුංග පරමාර්ථ එහිදී පෙරදැරි කොට ගැනිණි. දෙවියන් බුදුන් පිළිබඳ ඇති අචල විශ්වාසය හා ඇදහිල්ල මුල්කොටගත් නිසා මෙකී දේවකාරියන් ඔවුහු උසස් කොට සැලකූ හ. මුට්á නැමීම, මුට්ටි නැවුම් මංගල්ලාව f,ිත්, කිරි ඉතිරවීම, කිරි ඉතිරුම් මංගල්ලාව ලෙස ත් හැඳින්වූයේ එබැවිනි. 'මංගල්ලාව' යනු ගැමි ව්‍යවහරට අනුව දෙවියන්ට උපහාර හා පුද පූජා පිණිස උත්සවශ්‍රීයෙන් කෙරෙන පොරොන්දු ඉටුකිරීම යි.

මේවා දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන අභිචාර විධි ලෙස හඳුනාගත හැකි ය. 1889 දී R.W. Ievers විසින් ලියන ලද "The Custom of Polyandry in Ceylon" ග්‍රන්ථයෙහි ද මේ පිළිබඳ සඳහන් කොට ඇත. "අයියනා දෙවියන් උදෙසා කරනු ලබන මුට්ටි මංගල්ලය පිළිබඳ ව අයිවර්ස් ගේ විස්තරය"[24] නැමැති උපුටා ගැනීම ඒ සඳහා වන ප්‍රබල සාක්ෂියකි. මෙකී පුද පූජා හා දේවකාරි පිළිබඳ ව විමර්ශනාත්මක ව සාකච්ඡා කිරීම වෙනම ම කළයුතු කාරියකි.

---

22 කේ.බී. පොඩි අප්පුහාමි, **රජරටින් ගිලිහී යන ගැමි ජීවන රටා**, (කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2002), 164 පිට.

23 ඒ.පී.බී. මාමිනියාවේ ඉලංගසිංහ, **වැව්ගම් පඬුර: අපේ රැකියා, සිරිත් විරිත්, ඇදහිලි හා ජනවිඥාන විවරණය**, (කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009), 34 පිට.

24 රැල්ෆ් පීරිස්, **සිංහල සමාජ සංවිධානය**. (කොළඹ: සීමාසහිත සමන් ප්‍රකාශකයෝ, 1964), 270 පිට.

## සමෝධානය

කෙබඳු තත්වයන් යටතේ වුව ද, එකල වැව් ගම්මානවල ජීවත් වූ ගැමියා මේ සමාජ කාර්යභාරයන් ඉෂ්ට කළේ, සිය ගැමි ජන ජීවන ක්‍රමය තුළ කේන්ද්‍රීය ආයතනික ව්‍යුහය වූ 'වැව' මුල්කොටගෙන යි. මේ අනුව වැව් ජලය නිසි පරිදි භාවිතය ත්, වැව ආරක්ෂා කරගැනීම ත් උදෙසා උක්ත කෘෂිකාර්මික සමාජ ක්‍රමය තුළ ඔවුන් අනුගත නීති රීති හා ඊට අදාළ ව ගොඩනැගුණු සමාජ සන්නිවේදනාත්මක පසුබිම අතිශය සරල ය. නිරවුල් ය. එමෙන් ම මානවහිතවාදී ය. හුදෙක් රජරටට, නුවරකලාවියට හෝ වැව්බැඳි රාජ්‍යයට පමණක් නොව, සමස්ත මානව පරපුරේ අනාගත ප්‍රගතිය සඳහා වුව ද ඉන් උකහාගත හැකි ගරුගාම්භීර පුරුෂාර්ථයන් හා අභිමානවත් සමාජ සාරධර්මත් අපමණ ය.